**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය**

පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**ශාස්ත්‍රවේදි (සාමාන්‍ය) උපාධි පාඨමාලාව (බාහිර) සඳහා අයදුම්පත් කැඳවීම**
**2024 වර්ෂය**

මෙම විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් ක්‍රියාත්මක කරනු ලබන ශාස්ත්‍රවේදි (සාමාන්‍ය) උපාධි පාඨමාලාවේ (බාහිර) 2024 වර්ෂය සඳහා නවක සිසුන් (ගිහි හා පැවිදි දෙපාර්ශ්වයෙන්ම) බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**ශාස්ත්‍රවේදි (සාමාන්‍ය) උපාධි පාඨමාලාව (බාහිර) - Bachelor of Arts (General) Degree Programme (External)**

| | | |
|---|---|---|
| පාඨමාලා කාලය | : | වසර 03 |
| SLQF ස්තරය | : | Level 05 (Bachelor Degree) |
| අර්ඝ (Credits) | : | 96 |
| අවම සුදුසුකම් | : | 1. බුද්ධධර්මය, බෞද්ධශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත, සිංහල යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයක්වත් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම වශයෙන් ලකුණු 30 ක් ලබා තිබීම.<br><br>**හෝ**<br><br>2. ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම වශයෙන් ලකුණු 30 ක් ලබා තිබීම<br><br>සහ<br><br>අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දි බුද්ධධර්මය විෂයට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව සමත්වීම හෝ දහම් පාසල් අවසාන පරීක්‍ෂණය සමත්වීම.<br><br>**හෝ**<br><br>3. ප්‍රාචීන මධ්‍යම විභාගය භාෂාත්‍රයෙන් සමත්වීම<br><br>**හෝ**<br><br>4. ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගන්නා වෙනත් විභාගයකින් සමත්වීම |

**අ.පො.ස. (උසස් පෙළ) පදනම් කර ගනිමින් ඉල්ලුම් කරන අයදුම්කරුවන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හෝ පිරිවෙන් අවසාන විභාගය සමත්ව සිටීම අනිවාර්ය වේ.**

**අයදුම්පත් හා විස්තර පත්‍රිකා ලබා ගැනීම**

අයදුම්පත් හා විස්තර පත්‍රිකා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට කාර්යාල වේලාව තුළ පැමිණ හෝ විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.busl.ac.lk) හෝ රු.110 .00 ක මුද්දර ඇල වූ තම නම සහ ලිපිනය ලියන ලද 07×10 ප්‍රමාණයේ ලිපි කවරයක් **"නියෝජ්‍ය ලේඛකාධිකාරි, පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුරය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් ලබාගත හැකිය. එම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශාස්ත්‍රවේදි (සාමාන්‍ය) උපාධි පාඨමාලාව (බාහිර) සඳහා අයදුම්පත්‍ර ලබා ගැනීම"** යනුවෙන් සඳහන් කර තිබිය යුතුය.

**අයදුම්පත් ගාස්තුව**

අයදුම්පත් ගාස්තුව **රු. 3000/-** කි. මෙම මුදල ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ අංක **008-1001-7001-4461** දරන ගිණුමට බැර කළ හැකිය. (මහජන බැංකුවේ ගිණුම් අංකයට මුදල් බැර කරන විට ලදුපතෙහි **හේතුව** යන තීරයේ **EXD -09** ලෙස සඳහන් කිරීම අනිවාර්ය වේ.)

**අයදුම්පත් භාරදීම**

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත විස්තර පත්‍රිකාවේ සඳහන් ලියකියවිලි සමඟ 2024.07.05 දින හෝ ඊදිනට පෙර ඉහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ නැතිනම් 2024.07.05 දින හෝ ඊදිනට පෙර එම ලිපිනයට ගෙනවිත් භාර දිය යුතුය. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි (බාහිර) පාඨමාලාව සඳහා අයදුම් කිරීම - 2024 වර්ෂය**" ලෙස සඳහන් කළ යුතුය.

**අසම්පූර්ණ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්කරුවන් ගෙවා ඇති කිසිදු ගාස්තුවක් ආපසු ගෙවනු නොලැබේ.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අනුව විශ්වවිද්‍යාලයට බඳවා ගත හැකි ශිෂ්‍ය ප්‍රමාණය ඉක්මවා අයදුම්පත් ලැබී ඇති විට සුදුසුකම් සපිරූ අයදුම්කරුවන් තෝරා ගැනීමේ පරීක්ෂණයකට යොමු කොට එහිදි දක්වන කුසලතාව මත නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව බඳවා ගනු ලැබේ.

වැඩි විස්තර - පාඨමාලා සම්බන්ධීකාරක ස්වාමීන් වහන්සේ (071 - 8026869)
පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය (025 - 2057978)
විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය (www.busl.ac.lk)

ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,
අනුරාධපුරය.
2024.06.02